# කාන්තාවගේ සමාජ පුරාවිද්‍යාව : අනුරාධපුර යුගයට අයත් ස්තූපයන්ගේ ආයකයන්හි නිරූපණය කර ඇති කාන්තා රූප වෙත විශේෂ අවධානයකින් සිදුකරන අධ්‍යයනයකි

**එස්.එන්. කුමාරි**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.

nisansla.pera.92@gmail.com

ප්‍රමුඛ පදඃ ස්තූප ආයක, කාන්තාව, කැටයම්

මුල් ඓතිහාසික අවදියේ ලක්දිව තුළ ඉදි කරන ලද ස්තූප රැසක් දක්නට ලැබෙන අතර ස්තූපයන්ගේ ආරක්ෂාව උදෙසා සිව් දිශාවෙන් ආයකයන් ඉදිකර ඇත. වර්තමානයේ පුරාවිද්‍යාත්මක නටඹුන් වශයෙන් ඉතිරිව තිබෙන ආයක පිළිබඳ ව මූලික වශයෙන් අවධානය යොමු කිරීමේ දී හඳුනා ගැනීමට ලැබෙන සාධකයක් වශයෙන් කැටයම් පෙන්වා දිය හැකිය. ස්තූප ආයකයන් හි අලංකාරය මෙන් ම විවිධ ඇදහිලි විශ්වාසයන් නිරූපණය කිරීම උදෙසා මෙම කැටයම් නිර්මාණය කර තිබෙන බව පැවසිය හැකි ය. ස්තූප ආයකයන් හි දක්නට ලැබෙන කැටයම් වර්ග රැසක් ප්‍රධාන වශයෙන් හඳුනා ගැනීමට හැකිවේ. එනම් සත්ත්ව රූප, විවිධ සැරසිලි රටා, නාගනාගිනී රූප, නෙළුම් පදක්කම් කාන්තා රූප සහ පුරුෂ රූප ආදිය වේ. මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් අවදානයට ලක්කරනු ලබන්නේ ස්තූප ආයකයන්හි දක්නට ලැබෙන කාන්තා රූප පිළිබඳවය. ස්තූප ආයකයන් සඳහා කාන්තා රූප යොදා ගැනීමේ උපයෝගිතාව කුමක්ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වශයෙන් පෙන්වා දිය හැකිය. ස්තූප ආයකයන් හි දක්නට ලැබෙන කාන්තා රූප පිළිබඳඅධ්‍යයනය කිරීමේ දී ප්‍රාථමික සහ ද්විතීක මූලාශ්‍ර අධ්‍යයනය කිරීම, කෞතුකාගාර අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර ගවේෂණය මගින් තොරතුරු අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී තෝරාගන්නා ලද ස්තූප ආයකයන් කිහිපයක් පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ. එම ස්තූප ආයක නම් මිහින්තලේ කණ්ඨක චෛතිය, දීඝවාපිය, අභයගිරිය, රුවන්වැලි සෑය, මිරිසවැටිය, යඨාලතිස්ස, ජේතවන ස්තූපය සහ දක්ඛිණ තූපය පිළිබඳව අධ්‍යනය කරනු ලැබේ. මෙහි දී කාන්තාවගේ කැටයම් යොදා තිබෙන ස්ථානයන්, කාන්තාවගේ ඇඳුම්පැළඳුම් සහ කාන්තාවගේ ඉරියව් ආදිය පිළිබඳව මෙන්ම කාන්තාවන් අත දරා සිටින විවිධ උපකරණ සහ සංකේත, කාන්තාවට එක හිමිව තිබූ ස්ථානය, පන්ති විෂමතාව, කාන්තාව සහ බැඳුන විවිධ

විශ්වාස සහ ඇදහිලි ආදිය පිළිබඳ ව සමාජ පුරාවිද්‍යාත්මක වශයෙන් විධිමත්ව අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණයේ දී බලාපොරොත්තු වේ.

මුල් කාලීන ව ඉදිකරන ලද ස්තූප ආයකයන් අලංකාරවත් ව ඉදිකිරීමට කලාකරුවන් උනන්දු වූ බව වර්තමානයේ ශේෂ ව තිබෙන ස්තූප ආයකයන් අනුව පැහැදිළි ය. ස්තූපයන් හි ආරක්ෂාව මෙන් ම ස්තූපයේ අලංකාර බව ආයකයන් තුළ දක්නට ලැබෙන කැටයම් තුළින් හඳුනාගත හැකිය. මෙම පර්යේෂණයේ දී හඳුනාගන්නා ලද ප්‍රධාන ගැටලුව වනුයේ ස්තූප ආයකයන් සඳහා කාන්තා රූප යොදා ගැනීමේ උපයෝගිතාව කුමක් ද යන්න පිළිබඳ ව අධ්‍යයනය කිරීම ය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ ව අධ්‍යයනය කර නොමැති හෙයින් එම අවකාසය සම්පූර්ණ කිරිම උදෙසා මෙම පර්යේෂණය සිදුකරනු ලැබේ. මෙහි දි වර්තමානයේ පුරාවිද්‍යාත්මක නටඹුන් වශයෙන් ශේෂ ව තිබෙන ආයක වෙත අවදානය යොමු කරනු ලබන අතර ම කාන්තා රූපයන් ස්තූප ආයකයන් සඳහා භාවිත කිරීමට හේතු වූයේ කුමන සංකල්පයක් ද යන්න අධ්‍යයනයට බලාපොරොත්තු වේ.

කාන්තාවන්ගේ සමාජ පසුබිම එම කාලවකවානුව තුළ පැවති ආකාරය පිළිබඳ ව මෙන් ම කාන්තාවට එදා සමාජයේ හිමි ව තිබෙන ලද ස්ථානය එනම් මාතෘ මූලික සමාජයක් ද නැතිනම් කාන්තාව ගෘහයට පමණක් සීමා වූයේ ද යන්න අධ්‍යයනය කරනු ලබනවා. මෙම ආයකයන් තුළින් නිරූපිත කාන්තා රූපයන් මඟින් අධ්‍යයනය කිරීමට හැකියාව ලැබෙන අතර කාන්තා රූප සහිත කැටයම් යොදා තිබෙන ස්ථාන, කාන්තා රූප නිරූපණය කරනු ලබන ඉරියව්, කාන්තාවන් නිරත වී සිටින කාර්යයන්, කාන්තාවන් අත දරා සිටින විවිධ උපකරණ සහ සංකේත, කාන්තා රූප සහ පුරුෂ රූප යුගල වශයෙන් නිරූපණය කර තිබෙන ආකාරය, එකල සමාජයේ කාන්තාවට හිමි වූ තත්ත්වය කාන්තාවගේ ඇඳුම්පැළඳුම්, කාන්තා රූප සමඟ යොදා තිබෙන වෙනත් කැටයම්, කාන්තාව හා බැඳුණු විවිධ ඇදහිලි හා විශ්වාස (නාග නාගිනී රූප සහ ලක්ෂ්මී දේවිය ඇදහීම), එක ම අවදියේ නිර්මාණය කරන ලද ස්තූප ආයකයන් හි කාන්තා රූපවල විවිධ වෙනස්කම්, විවිධ පන්ති නිරූපණය කරන ලද කාන්තා රූප, ඉන්ද්‍රිය ආභාසය නිරූපණය කරන ලද කාන්තා රූප ආදිය පිළිබඳ ව මෙම පර්යේෂණයේ දි අධ්‍යයනයට බලාපොරොත්තු වේ.

කාන්තා නිරූපණත්වය පිළිබඳ ව විවිධ අධ්‍යයනය කර තිබෙන නමුත් ස්තූප ආයකයන් තුළ නිරූපණය වන කාන්තා රූප පිළිබඳ ව මෙතෙක් විධිමත් ව අධ්‍යයනයක් කර නොමැති බැවින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මඟින් එකල සමාජයේ කාන්තාව පිළිබඳ ව තොරතුරු අධ්‍යයනය කිරීමට හැකි ය. ග්‍රැනයිට් හෝ හුණුගල තුළ සියුම් ආකාරයෙන් කාන්තා ලාලිත්‍ය ආදිය අලංකෘත ආකාරයෙන් නිරූපණය කර තිබීම පුදුම සහගත ය. කලාකරුවා

ජීවත්වන සමාජයේ ඇස ගැටෙන ප්‍රායෝගික ව අත්දකින ක්‍රියාවන් මේ ආකාරයෙන් නිරූපණය කිරීම තුළින් ද එම සමාජය තුළ තොරතුරු වර්තනමානයේ අධ්‍යයනය කිරීමට හැකි වන මූලාශ්‍රයක් වශයෙන් ද දැක්විය හැකි ය.

මුල් කාලීන ව ඉදිකරන ලද ස්තූප ආයකයන්හි නිරූපිත කාන්තාවගේ සමාජ පුරාවිද්‍යාව පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමවේදය වශයෙන් පුස්තකාලය අධ්‍යයනය කරමින් මෙම තේමාව සම්බන්ධ ව මෙයට පෙර සිදුකර තිබෙන පර්යේෂණ පිළිබඳව අධ්‍යයනය කරනු ලබනවා. ප්‍රාථමික සහ ද්විතීක මූලාශ්‍ර විමර්ෂණය කරනු ලබන අතර එමඟින් පර්යේෂණයට අදාළ තොරතුරු අධ්‍යයනය කරනු ලබනවා. කොළඹ ජාතික කෞතුකාගාරය අධ්‍යයනය සහ ක්ෂේත්‍රයන් ආශ්‍රිත ව පිහිටුවා තිබෙන කෞතුකාගාර අධ්‍යයනය කරමින් තොරතුරු අධ්‍යයනය කරනු ලැබේ. අධ්‍යයනය කරනු ලබන ක්ෂේත්‍රයන් ආශ්‍රිතව වර්තමානය වන විට සිදුකර තිබෙන කැනීම් සහ ගවේෂණ ආදිය මඟින් හමු ව තිබෙන පුරාවිද්‍යාත්මක නටඹුන් කැටයම් පුවරු ආදිය කෞතුකාගාරයන්හි තැන්පත් කර තිබෙන බැවින් කෞතුකාගාර අධ්‍යයනය කිරීම මඟින් පර්යේෂණය සඳහා තොරතුරු ලබාගැනීමට හැකි ක්‍රමවේදයක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

පර්යේෂණය උදෙසා තෝරාගන්නා ලද ආයක පිළිබඳ ව තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය කිරීම අත්‍යවශ්‍ය බව පැවසිය හැකි ය. මෙහි දී ඡායාරූප ගැනීම සහ දල සැලසුම් ඇඳීම ආදිය මඟින් දත්ත රැස් කිරීම සිදුකරනු ලැබේ. ක්ෂේත්‍ර ගවේෂණය සිදු කිරීම මඟින් ස්තූප ආයකයන් සහ කැටයම් සෘජු නිරීක්ෂණයක් කිරීමට හැකි ය. ක්ෂේත්‍රය ආශ්‍රිත තොරතුරු ලබා දීමට සිටින විවිධ පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම ආදිය විවිධ ක්‍රමවේද මඟින් පර්යේෂණය සඳහා තොරතුරු අධ්‍යයනය කරනු ලබනවා.

තෝරාගන්නා ලද නියැදිකරණය නම් අනුරාධපුර යුගයේ ඉදිකරන ලද ස්තූප ආයකයන් ය. මෙහි දී වැඩි වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශේෂ ව ඇති ස්තූප ආයක හයක් පිළිබඳ ව මෙන් ම හම්බන්තොට දිස්ත්‍රික්කයේ යටාලතිස්ස සහ අම්පාර දිස්ත්‍රික්කයේ දීඝවාපිය යන ස්තූපයන් මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කරන ලද නියැදිකරණය වශයෙන් පෙන්වා දිය හැකි ය. එම ස්තූප ආයකයන් දිස්ත්‍රික්කයන් අනුව පෙන්වා දිය හැකි ය. අනුරාධපුර, කණ්ඨක චෛතිය, අභයගිරිය ස්තූපය, රුවන්වැලි සෑය, ජේතවන ස්තූපය, මිරිසවැටිය ස්තූපය, දක්ඛිණ තූපය, අම්පාර, දීඝවාපිය හම්බන්තොට යඨාල තිස්ස ස්තූප ආයකයන් පෙන්වා දිය හැකි ය. මේ ආකාරයෙන් තොරතුරු ගවේෂණය කරනු ලබන ක්‍රමවේදය සහ නියැදිකරණය පෙන්වා දිය හැකි ය.

මෙම පර්යේෂණය සිදු කිරීමේ දි අවසන් වශයෙන් අවධානය යොමු කිරීමේ දි පෙනී යන්නේ කාන්තා රූප

රූසක් දක්නට ලැබෙන අභයගිරිය ස්තූප ආයකයහි දක්නට ලැබෙන කාන්තා රූපයන් ද පුරුෂ රූපයට පහළින් නිමවා ඇත. මෙහි විශේෂත්වය වනුයේ උඩුකය නිරුවත්ව සිටින කාන්තා රූපයන් ය. මේවා වඩාත් පැහැදිළි ආකාරයෙන් දක්නට ලැබෙන නමුත් සමහර කැටයම් විනාශයට පත්ව ඇත. සමහර කාන්තා රූප පරිවාර කාන්තා රූපයන්ද නිර්මාණය කර තිබෙන බව දක්නට ලැබේ. මෙම කැටයම් අධ්‍යයනය කිරීමේදි පෙනි යන්නේ ප්‍රභූ පන්තියේ කාන්තාවන් ප්‍රමාණයෙන් විශාලව නිමවා ඇති අතර පරිවාර කාන්තාව කුඩාවට නිර්මාණය කර තිබෙන බවයි. කුණ්ඩලාබරණ සහ අත්වල ආභරණ ආදිය පැළඳ සිටී. යටිකය ධෝතියකින් ආවරණය කරගෙන තිබෙන බව දක්නට ලැබේ. බොහෝ දුරට ත්‍රිභංග ඉරියව්වෙන් සිටින ආකාරය දක්නට ලැබේ.

ජේතවනයේ දක්නට ලැබෙන කාන්තා රූපයන් හි හිස වටා නාගපෙන සහිත ව දක්වා තිබෙන බැවින් නාගිනී රූපයන් වශයෙන් හඳුනාගෙන ඇත. පුරුෂ රූපයන්ගේ හිස වටාද නාගපෙන සහිතව දක්වා තිබෙන බැවින් නාග රූප වශයෙන් අර්ථකතනය කර තිබෙන බව පැවසිය හැකි ය. නයිපෙන කිහිපයක් මෙම හිස්වල නිර්මාණය කර තිබෙන බව දක්නට ලැබේ. කාන්තාවන් හා පුරුෂ රූපයන් උඩුකය නිරුවත් ව සිටින අතර ගෙලෙහි ආභරණ පැළඳ සිටී. යටිකය අලංකාර ධෝතියකින් ආවරණය කරගෙන සිටින ආකාරය දක්නට ලැබේ. මෙහි දක්නට ලැබෙන කාන්තාවන් ස්තූපයෙන් ස්තූපයට වෙනස්වන ආකාරයක් දක්නට ලැබෙන බව පැවසිය හැකි ය. මෙම ස්තූප ආයක දෙකෙහි ම දක්නට ලැබෙනුයේ ආයකයේ ඉහළින් පුරුෂ රූපය නිර්මාණය කර තිබෙන අතර පහළින් කාන්තා රූපය නිර්මාණය කර තිබෙන බව පැවසිය හැකි ය. නමුත් කණ්ඨක චේතියේ මිථුන රූපයක් වශයෙන් කාන්තාව සහ පුරුෂ රූපයන් දක්වා ඇත. මිරිසවැටිය ස්තූපය හි ආයකය සඳහා කාන්තා රූප යොදාගෙන තිබෙන බවක් දක්නට නොමැති අතර අනෙකුත් ආයකයන් සියල්ල සඳහා ම කාන්තා රූපයන් යොදා තිබෙන බවක් දක්නට ලැබේ. පැරණි ජනසමාජය තුළ කාන්තාව අපිරිසිදු යැයි දක්වා ඇත. එම සංකල්පය මත රුදෙමින් මිරිසවැටිය ස්තූප ආයකය සඳහා භාවිත කිරීමෙන් වැලකී සිටින්නනට ඇතැයි උපකල්පනය කිරීමට පිළිවන. මෙම කාන්තා රූප යෙදීම මඟින් එකල ජන සමාජය තුළ කාන්තාව විසින් භාවිත කරන ලද්දේ මාතෘ දෙවඟන ඇදහීම යන සංකල්පය මත ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් ය. කාන්තා රූප යොදා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් අපට හඳුනා ගැනීමට හැකියාව ලැබෙනුයේ සමාජයේ ප්‍රභූ කාන්තාවන් යොදාගෙන තිබෙන බව ය.

මෙම ස්තූප ආයකයන් හි නිරූපණය කර තිබෙන කාන්තා රූපයන් නිරූපණය කරනු ලබන ඉරියව් දෙස අවදානය යොමු කර බැලීමේ දී ත්‍රිභංග ඉරියව් බොහෝ දුරට

නිරූපණය කර තිබේ. විවිධ අංචලනයන් නිරූපනය කිරීමට නිර්මාණ ශිල්පියා සමත් ව තිබෙන බව පැවසිය හැකි ය. මෙම කාන්තාවන් නිරූපණය කිරීමේ දි ඔවුන් අතදරා සිටින විවිධ සංකේත සහ උපකරණ ආදිය හඳුනා ගැනීමට හැකියාව ඇත. නිදසුනක් වශයෙන් අභයගිරිය ස්තූපය ආයකයේ දැක්වෙන කාන්තා රූපයක හිස මත කිසියම් ද්‍රව්‍ය අතුරන ලද වට්ටියක් ආදිය දක්නට ලැබෙන බව පැවසිය හැකි ය. ජේතවන ස්තූප ආයකයේ දැක්වෙන නාගිනි රූපයන්හි විවිධ සංකේතයන් දක්නට ලැබේ. සංඛය සහ පද්මය ආදිය පෙන්වා දිය හැකි ය. කාන්තා රූපයන්ගේ කන්, අත් හා ගෙලෙහි ආභරණ පැළඳ සිටන බව පැහැදිළිව හඳුනාගත හැකි ය. පරිවාර කාන්තාවන් අල්ප ආකාරයෙන් ආබරණ පැළඳ සිටන බව පැවසිය හැකි ය. මෙමගින් උපකල්පනය කිරීමට හැකියාව ලැබෙනුයේ එයින් ද එකල සමාජයේ සමාජ පන්තිය නරූපණය කිරීමට උත්සහ ගෙන තිබෙන බව ය. ඇඳුම්පැළඳුම් තුළින් ද කාන්තාවට එකල සමාජයේ ප්‍රභූ සහ සාමාන්‍ය ජනයා යනුවෙන් වර්ග කොට තිබෙන බව ය.

මුල් කාලීන ව ලියන ලද සෙල්ලිපි අධ්‍යයනය කිරීම තුළින් එදා ජන සමාජය තුළ කාන්තාවන් හඳුනාගෙන තිබෙනුයේ මව, බිරිද, උපාසිකා, තෙරණි, හොහොයුරිය, දියණිය, කුමාරිකාව ආදිය වශයෙනි. මෙම නාමයන් ද දැක්වීමේ දි ප්‍රධාන වශයෙන් පියාගේ නම සඳහන් කිරීමක් දක්නට ලැබේ. පුරුෂයා කේන්ද්‍ර කොටගෙන එදා සමාජය පැවති බව නිගමනය කිරීමට හැකියාව ඇත. ස්තූප ආයකයන් හි නිරූපණය කර තිබෙන කාන්තා රූපයන් ද පුරුෂ රූපය ඉහළින් නිරූපණය කරමින් පහතින් කාන්තා රූපය නිරූපණය කර තිබෙන බව පැවසිය හැකි ය. මුල් කාලීන ව කාන්තාව තම පියාගේ හෝ පුරුෂයාගේ තනතුරු හෝ නාමය භාවිත කරමින් තම නම් ආදිය දක්වා තිබෙන අතර උසස් තනතුරු දරන ලද බවක් දක්නට නොමැත. එබැවින් පුරුෂාධිපත්‍ය නිරූපණය කරමින් තමන්ට කාන්තාවන් යටහත් පහත් ව සිටිය යුතු බව සමාජයට විදහා දැක්වීම සඳහා ස්තූප ආයකයන්හි කාන්තා රූප යොදාගන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ බව නිගමනය කිරීමට හැකිවනුයේ කාන්තාව පුරුෂයාට පහළින් නිරූපණය කිර තිබෙන බැවිනි.

මුල් කාලීන ව අනුරාධපුර යුගය තුළ ලංකාවේ ඉදිකරන ලද ආයකයන් හි නිදර්ශිත කාන්තාවගේ සමාජ පුරාවිද්‍යාව මැයෙන් සිදු කරන ලද පර්යේෂණයේ දී නිගමනය කිරීමට හැකියාව ලැබෙනුයේ එකල සමාජයේ කාන්තාවට හිමි ව තිබෙන තත්ත්වය මනා ලෙස අධ්‍යයනය කිරීමට ආයක කැටයම් මූලාශ්‍රයක් වන බව ය. සමාජීය පුරාවිද්‍යාත්මක වශයෙන් සමාජීය පන්තිය, කුටුම්බය කාන්තාව හා නිරන්තරයෙන් බද්ධ ව තිබෙන ආකාරය, එ මෙන් ම පරම්පරාවට කුලය සහ පන්තිය දායාද කිරීමේ කාර්යය සඳහා ඍජු දායකත්වය, ආදිය සියල්ල මෙම ආයක කැටයම් මඟින් නිරූපිත කාන්තා රූපයන්

මඟින් අධ්‍යයනය කිරිමට හැකියාව ඇත. නිගමනය වශයෙන් කාන්තා රූප ස්තූප ආයකයන් සඳහා යොදා ගැනිමට එකල කලා නිර්මාණයන් කරන ලද කලා නිර්මාණ ශිල්පියා උත්සහය ගෙන තිබෙනුයේ එ කල සමාජ තත්ත්වය නිරූපණය සහ කලා නිර්මාණයන් තුළින් ද කාන්තාව පුරුෂයාට යටහත් පහත් වීම මෙන් ම කාන්තාව කිසියම් රාමුවකට සමාජය තුළ සීමා වී තිබෙන බව පෙන්වීම උදෙසා බව නිගමනය කිරීමට හැකි ය.